**#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina #May06**
යම් පුවතක් විකෘති කොට ඉදිරිපත් කිරීම හෝ එම අරමුණ ඇතිව වැරදි අර්ථකතනයන් සැපයීම යනු මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කිරීමක් බව ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් නිකුත් කොට ඇති වෘත්තිය ප්‍රතිපත්ති මාලාවේ සඳහන් කොට ඇත. ජනමාධ්‍යවේදියෙකු දැන දැනම හෝ හිතාමතා හෝ ජනවාර්ගික හෝ ආගමික අසමගියට හෝ ප්‍රචණ්ඩත්වයට අනුබල නොදිය යුතු බවද එහිම සඳහන්ව ඇත.

දිවයින පුවත්පතේ සිරස්තලයකින් දක්වා ඇත්තේ, උතුරු නැගෙනහිර පන්සල් තැනීම තහනම් කරන්න යනුවෙන් ද්‍රවිඩ සන්ධානය ඉල්ලා සිටිනා බවටයි (වම් පස). කෙසේ වෙතත් ද්‍රවිඩ ජාතික සන්ධානය (TNA) මගින් නිල වශයෙන් නිකුත් කොට ඇති ප්‍රකාශයේ සඳහන් වන්නේ, එම දිවයින ප්‍රවෘත්තිය මගින් කරුණු විකෘති කොට සම්පූර්ණ අසත්‍යයක් ඉදිරිපත් කොට ඇති බවටයි (දකුණු පස).

මෙහිදී සාවද්‍ය අර්ථකතන සැපයීමක් දිවයින පුවත්පත මගින් සිදුකර ඇති බවත්, එසේම එම සාවද්‍ය අර්ථකතනය මගින් වාර්ගික ආතතියක්, එදිරිවාදී කමක් පැන නැගීමේ හැකියාවක්ද ඇති බවත්, ඒ නයින් මාධ්‍ය ආචාර ධර්මයන් උල්ලංඝනයක් සිදුවී ඇති බවත් පැහැදිලිව පෙනී යන කරුණකි. අද දිනය වනවිටද ඒ සඳහා නිවැරදි කිරීමක් හෝ කණගාටුව ප්‍රකාශ කිරීමක් පළ කිරීමටද දිවයින පුවත්පත කටයුතු කොට නොමැති බවද පෙනී යයි. වාර්තාවක් කරුණු අතින් වැරදි යැයි පෙනී යන අවස්ථාවකදී එය වහාම නිවැරදි කළ යුතු බවද වෘත්තිය ප්‍රතිපත්ති මාලාවේ සඳහන් වන බවද පෙන්වා දෙමින්, දිවයින පුවත්පත මගින් එම නිවැරදි පියවර අනුගමනය කරනු ඇතැයි පාඨක අපි බලාපොරොත්තු වෙමු.